සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 09 - 2023

## ඉතිහාසය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

### I - පත්‍රය

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරුවලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) ඉන්දියන් සාගරයේ තම වෙළෙඳ බලය ගොඩනැගීමේ දී ලන්දේසීන්ට සටන් වදින්නට සිදුවූයේ ,

1. පෘතුගීසීන් සමඟ ය. 3. මුස්ලිම්වරුන් සමග ය.
2. ඉංග්‍රීසීන් සමග ය. 4. ඉන්දියානුවන් සමග ය.

02) ඉංග්‍රීසීන් උඩරට රාජධානිය යටත් කරගත් අවධියේ දී මෙරට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා ලෙස කටයුතු කළේ කවුරුන් ද?

1. පෙඩ්රික් නෝර්ත් 2. ටොරින්ටන් සාමි 3. තෝමස් මේට්ලන්ඩ් 4. රොබට් බ්‍රවුන්රිග්

03) පෘතුගීසීන් විසින් තම පෙරදිග පාලන මධ්‍යස්ථානය ලෙස තෝරාගනු ලැබුවේ,

1. සූරාට් ය. 2. පොන්ඩිචෙරි ය. 3. බතාවිය ය. 4. ගෝව ය.

04) ශ්‍රී ලංකාවේ දෙවන නිදහස් සටන හෙවත් 1848 කැරැල්ලට පෙරමුණ ගන්නා ලද්දේ කවුරුන් ද?

1. රදළ ප්‍රධානීන් 2. පොදුජනතාව 3. භික්ෂූන් වහන්සේලා 4. සුළු මුලාදෑනිවරුන්

05) දේශීය සංස්කෘතිය ආරක්ෂා කරගැනීමේ අරමුණින් ඩී.බී ජයතිලක මහතා,

1. ඓතිහාසික සිදුවීම් ඇතුළත් කර නාට්‍ය රචනා කරන ලදි.
2. ප්‍රබන්ධ නවකතා හා කෙටි කතා රචනා කරන ලදි.
3. අනුරාධපුරයේ බෞද්ධ පූජනීය ස්ථාන රැකගැනීමට කටයුතු කරන ලදි.
4. කොළඹ තරුණ බෞද්ධ සංගමය පිහිටුවන ලදි.

- අංක 06 සිට 10 දක්වා ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදිනම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06) පොන්නම්බලම් අරුණාචලම් මහතා මෙරට ව්‍යවස්ථාදායක සභාවට පත් වූ ප්‍රථම උගත් ශ්‍රී ලාංකික මන්ත්‍රීවරයා වේ. ( )

07) ඉන්දියානු සටන් ව්‍යාපාරයේ නායකයෙකු වූ සී.ආර් දාස් අත්අඩංගුවට ගත් පසු බෙංගාල තරුණයින් කුපිත විය. ( )

08) ක්‍රි.ව 1978 ආණ්ඩුක්‍රමයට අනුව රජයේ උසස් නිලධාරීන් පත්කිරීමට ඇති බලය ජනාධිපතිවරයා සතු විධායක බලතල වලින් එකකි. ( )

09) රාජ්‍ය මන්ත්‍රණසභා යුගයේ දී මෙරට ගොවිජනපද පිහිටුවීමේ ව්‍යාපාරය ආරම්භ කරන ලදි. ( )

10) වර්ෂ 1959 දී මෙරට ප්‍රථම කාර්මික ජනපදය ඒකල ප්‍රදේශයේ දී පිහිටුවන ලදි. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

11) පළමුවන විමලධර්මසූරිය රජු ඉදිරියේ දී රජුට අගෞරව වන ලෙස හැසිරුන ලන්දේසි ජාතික..................... රජුගේ පිරිස සමඟ ඇති වූ ගැටුමක ප්‍රතිඵලයක් වශයෙන් අවාසනාවන්ත ලෙස මරණයට පත් විය.

12) පෘතුගීසීන්ගේ කාලයේ සිට කුරුඳු එක් රැස් කිරීම හා වෙළෙඳාම සඳහා පැවති ............................... දෙපාර්තමේන්තුව ලන්දේසීන් විසින් වෙන ම කපිතාන්වරයෙකු යටතට පත් කොට වඩා කාර්යක්ෂම කරන ලදි.

13) වළවේ ගඟ හා උඩුකිරිවල ආශ්‍රිත වාරිකර්මාන්ත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ................................ ආණ්ඩුකාරවරයා මූලික වී කටයුතු කරන ලදි.

14) සමස්ත ඉන්දියාව ම නියෝජනය වන පරිදි ඉන්දියානු ජාතික සංගමය පිහිටුවීම සඳහා .......................... මහතා මූලිකත්වය ගෙන කටයුතු කරන ලදි.

15) වර්ෂ 1931 වසරේ දී බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දුන් ..........................................ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින් ශ්‍රී ලාංකික ජනතාවට සර්වජන ඡන්ද අයිතිය හිමි විය.

( මහබද්දේ / සෝල්බරි / ආතර් ගෝඩ්න් / මඩිගේ බද්දේ / ඩොනමෝර් / ඇලන් ඔක්ටේවියන් හියුම්/ සීබෙල් ද වර්ට් / ජෝන් පයිබස් )

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර කුමක්දැයි ලියා දක්වන්න.**

16) ක්‍රි. ව. 1877 වසරේ දී පේරාදෙණිය හා ................................................. උද්‍යානයේ මුලින්ම රබර් පැළ රෝපණය කිරීමත් සමඟ ලංකාවේ රබර් වගාව ආරම්භ විය.

17) උඩරට ගිවිසුමේ දෙවන වගන්තියේ .................................. රජු සිහසුනෙන් නෙරපන ලද බවත් ඔහුගේ සියලු ම ඥාතීන්ට උඩරට සිහසුන පිළිබඳ තිබූ සෑම අයිතිවාසිකමක් ම අහෝසි වූ බවත් සඳහන් වේ.

18) දෙමළ සිසුන්හට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීම සඳහා ආරුමුග නාවලර්තුමා විසින් යාපනයේ ..................... විද්‍යාලය ආරම්භ කරන ලදි.


19) ඉංග්‍රීසීන්ගේ ආර්ථික ප්‍රතිපත්ති නිසා ඉන්දියාව දිනෙන් දින දුප්පත් රටක් බවට පත් වන බව මුලින් ම පැහැදිලි කළ නායකයෙකු ලෙස ...................................... ප්‍රසිද්ධියක් උසුලයි.

20) සෝල්බරි ආණ්ඩුක්‍රමය මගින් නීතිරීති සම්පාදනය හෙවත් ව්‍යවස්ථාදායක කටයුතු සඳහා ................................ හඳුන්වා දෙන ලදි.

(ලකුණු 2 x 20 = 40)

## II - කොටස


- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.




01)

(අ) i. දෙවන නිදහස් සටනේ ප්‍රධාන මූලස්ථානය සිතියමේ A අක්ෂරයෙන් දැක්වේ. එම ප්‍රදේශය හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 2)

ii. විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාරවරයා විසින් ප්‍රතිසංස්කරණය කරන ලද කලාවැව දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද? (ලකුණු 2)




(ආ) i. වස්කෝද ගාමා ඉන්දියාවට ගොඩ බසින ලද කැලිකට් වරාය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද? (ලකුණු 2)

ii. මොහොමඩ් අලිජින්නාගේ නායකත්වය යටතේ මුස්ලිම් ලීගය විසින් පිටුවාගන්නා ලද පකිස්තානය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද? (ලකුණු 2)


A

(ඇ) i. A පින්තූරයෙන් දැක්වෙන රජතුමා කවුරුන් ද?
ii. ඔහු කුමන රාජධානියක පාලකයෙක් ද?
iii. මෙතුමා මුණගැසීම සඳහා ක්‍රි.ව. 1656 දී උඩරටට පැමිණි ලන්දේසි දූතයා කවුරුන් ද?
iv. මෙතුමා ලන්දේසීන් සමග ලිපි ලිවීමේ දී භාවිත කළ විරුද නාමය කුමක් ද?
(ලකුණු 4)


B

(ඈ) i. B පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා කවුරුන් ද?
ii. ඔහු 1956 පැවති මහ මැතිවරණයට ඉදිරිපත් වූ දේශපාලන පක්ෂය කුමක් ද?
iii. මෙතුමාගේ මරණයත් සමග පුරප්පාඩු වූ අගමැති ධුරය සඳහා පත්වූයේ කවුරුන් ද?
iv. මෙතුමා ගේ මරණයෙන් පසු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයට පත් වූයේ කවුරුන් ද? (ලකුණු 4)

02)

i. උඩරට බලයට පත් නායක්කර් රාජවංශයේ ආරම්භක පාලකයන් දෙදෙනා නම් කරන්න. (ලකුණු 2)

ii. සහල් හා රෙදිපිළි ආදිය විදේශවලින් ආනයනය කිරීමෙන් වෙළෙඳ සමාගමට වැය වන මුදල් අඩු කර ගැනීම සඳහා ලන්දේසීන් ගත් ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ලකුණු 4)

iii. ලන්දේසීන් විසින් ලංකාවේ පිහිට වූ පාසල් වර්ග දෙකක් නම් කර ඒවායේ අධ්‍යාපන කටයුතු සිදු වූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

03)

i. උඩරට ට පැමිණි රාජාධි රාජසිංහ රජු මුණගැසුන ඉංග්‍රීසි ජාතික දූතයන් දෙදෙනා නම් කරන්න (ලකුණු 2)

ii. පහත සඳහන් ප්‍රශ්වලට පිළිතුරු සපයන්න.

A. ක්‍රි. ව. 1818 නිදහස් සටනේ දී දුම්බර හා තුම්පනේ ප්‍රදේශයන්ට නායකත්වය ලබාදුන් රදළ වරයා

B. දෙවන නිදහස් සටනේ නායකයෙකු වූ ගොන්ගාලේගොඩ බණ්ඩා දඹුල්ලේදී රජබවට පත් වූ නම

C. ලංකාවේ කෝපි වගාව විනාශ වීමට හේතු වූ දිලීර රෝගය

D. ලංකාවේ පළමු තේ වත්ත ආරම්භ කරන ලද පුද්ගලයා (ලකුණු 4)

iii. තේ වගාව මෙරට ප්‍රමුඛ අපනයන ආර්ථික භෝගය බවට පත් වීමට බලපෑ හේතු දෙකක් දක්වා කෙටියෙන් පහදන්න

(ලකුණු 5)

04)

i. 19 වන සියවස මුල් භාගයේ දී ශ්‍රී ලංකාවට පැමිණි මිෂනාරී සංවිධාන දෙකක් නම් කරන්න. (ලකුණු 2)

ii. පහත සඳහන් ප්‍රශ්වලට පිළිතුරු සපයන්න.

A. පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කරන ලද්දේ කවුරුන් විසින් ද?

B. පානදුරා වාදය පිළිබඳව ලියවුණ කුඩා පොතක් කියවීමෙන් පැහැදුණ ඇමරිකානු ජාතික හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා සමග ලංකාවට පැමිණි කාන්තාව නම් කරන්න.

C. පරමේශ්වර විද්‍යාලය ආරම්භ කර හින්දු දරුවන්ගේ අධ්‍යාපනයේ උන්නතියට කටයුතු කළ පුද්ගලයා කවුරුන් ද?

D. කොළඹ සහිරා විද්‍යාලයේ විදුහල්පති ධූරය දරමින් ද, ව්‍යවස්ථාදායකයේ නියෝජිතයෙකු ලෙස කටයුතු කරමින් ද ඉස්ලාම් ආගමික පුනරුදයට දායක වූ පුද්ගලයා කවුරුන් ද? (ලකුණු 4)

iii. 19 වන සියවස අගභාගය වන විට මෙරට ස්වදේශිකයන් අතර ආගමික ප්‍රබෝධයක් ඇතිවීමට බලපෑ හේතු දෙකක් දක්වා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

05)

i. ඉන්දියාවට පත්ව ආ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරු යුද්ධ මගින් මෙන් ම වෙනත් උපායශීලි කටයුතු මගින් ද, ඉන්දියාව තුළ තම බලය පැතිරවීමට ක්‍රියා කරන ලදි. එවැනි උපායශීලී ක්‍රියාමාර්ග දෙකක් නම් කරන්න

(ලකුණු 2)

ii. පහත සඳහන් ප්‍රශ්වලට පිළිතුරු සපයන්න.

A. ඉන්දියානු ජාතික සංගමය තුළ සිටි මධ්‍යස්ථවාදීන් දෙදෙනෙකු නම් කරන්න.

B. හින්දු ජනතාව තුළ ආගමික හා සංස්කෘතික පිබිදීමක් ඇති කිරීම සඳහා රාම් මෝහන් රෝයි මහතා පිහිටුවා ගත් සංවිධානය කුමක් ද?

C. ඉන්දියාවේ අවසන් බ්‍රිතාන්‍ය ප්‍රතිරාජයා වශයෙන් පත්වූයේ කවුරුන් ද?

(ලකුණු 4)

iii. ඉන්දියානු සටන් ව්‍යාපාරය තුළ සිදුවූ ජලියන්වලා බාග් ඛේදවාචකය හා දණ්ඩි පා ගමන යන සිදුවීම් දෙක කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

(5) WWW.PastPapers.WiKi (4)



Download Term Test Papers, Short Notes From One Place!

06)


i. දැනට ලංකාවේ ක්‍රියාත්මක පළාත් අතරින් මුලින්ම බිහිවූ පළාත් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

ii. කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල කැපී පෙනෙන ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 4)

iii. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින් හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ යෝජනා දෙකක් නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

07) ඡායාරූප සටහනේ ඇති පින්තූර ඇසුරෙන් තොරතුරු වගුව සම්පූර්ණ කරන්න.

ඔබේ පිළිතුරු පත්‍රයේ අංක 1 සිට 12 දක්වා අංක යොදා නිවැරදි පිළිතුර හෝ ඉංග්‍රීසි අක්ෂරය ලියන්න.




| ප්‍රශ්නය | පිළිතුර | පිළිතුරට සම්බන්ධ ඡායාරූපයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය |
|---|---|---|
| නිදහස් ශ්‍රී ලංකාවේ පළමු අගමැතිවරයා | 1 ...................................... | 2 ...................... |
| ලංකාවේ ක්‍රියාත්මක වූ හර්තාල් ව්‍යාපාරයක් නිසා ඉල්ලා අස්වූ අගමැතිවරයා | 3 ...................................... | 4 ...................... |
| ශ්‍රී ලංකාවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලැබූ අවධියේ මෙරට අගමැතිවරයා | 5 ...................................... | G |
| 1972 ස්ථාපිත කරන ලද පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ඉහළ අධිකරණ ආයතන දෙකින් එකකි. | ශ්‍රේෂ්ඨාධිකරණය | 6 ...................... |
| 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාදායකය | 7 ...................................... | 8 ...................... |
| ලංකාවේ පළමු ජනාධිපතිවරයා | 9 ...................................... | E |
| ශ්‍රී ලංකාවේ පිහිටි විශ්වවිද්‍යාලයකි | 10 ...................................... | 11 ...................... |

(5) www.PastPapers.WiKi (5)



Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 09 - 2023**

# ඉතිහාසය – පිළිතුරු පත්‍රය

## I කොටස

1. - පෘතුගීසි
2. - රොබට් බ්‍රවුන්රිග්
3. - ගෝව
4. - පොදු ජනතාව
5. - (4)
6. - ✗
7. - ✓
8. - ✓
9. - ✓
10. - ✓
11. සිබෙල් ද වර්ට්
12. මහබද්දේ
13. ආතර් ගෙර්ඩින්
14. ඇලන් ඔක්ටේවියන් හියුම්
15. ඩොනමෝර්
16. හෙනරත්ගොඩ
17. ශ්‍රී වික්‍රම රාජසිංහ
18. ශිවන්ගල
19. දඩාභායි නඕරෝජි
20. පාර්ලිමේන්තුව

( 20 x 2 = 40)

## II කොටස

01)

(අ) i. මාතලේ
 ii. C

(ආ) i. A
 ii. B

(ඇ) i. A දෙවන රාජසිංහ රජු
 ii. මහනුවර
 iii. ජෙරාඩ් හල්ෆ්ට්
 iv. "ශ්‍රී සිංහලාධීශ්වර"

(ඈ) i. බණ්ඩාරනායක මහතා
 ii. මහජන එක්සත් පෙරමුණ
 iii. විජයානන්ද දහනායක
 iv. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය

02)

i. ශ්‍රී විජය රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ

ii. මුතුරාජවෙල අස්වැද්දීමට
 රෙදි විවීම, සායම් කිරීම, උළු, ගඩොල් කර්මාන්ත දියුණු කිරීම.
 උක්, ගම්මිරිස්, එනසාල්, කෝපි, මල්බෙරි වගාවන් දියුණු කිරීම.

iii. ඉස්කෝල, සෙමනේරි ( විස්තර කිරීම පිටුව 18)

03)

i. හියුබොයිඩ් / රොබට් ඇන්ඩෘස් (රාජාධි රාජසිංහ)

ii. A - මඩුගල්ලේ
 B - ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි
 C - හෙමලියා වෙස්ටර්ට්‍රික්ස්
 D - ජේම්ස් ටේලර්

(2) WWW.PastPapers.WiKi (1)



Download Term Test Papers, Short Notes From One Place!

iii. ශ්‍රී ලංකාවේ තේ සඳහා ලන්ඩන් හා ලෝක වෙළඳපොලේ ඉහළ ඉල්ලුමක් තිබීම.
අඩු නිෂ්පාදන වියදමකින් වැඩි ලාභ ඉපයීමට හැකි වීම.

අක්කර 10ක කුඩා යායකින් ඇරඹුණු තේ වගාව 1890 වර්ෂය පමණවන විට විශාල ප්‍රගතියක් අත්කරගෙන තිබුණි. ආසන්න වශයෙන් අක්කර 2,20,000 කට වැඩි ප්‍රමාණයක් ඒ වන විට ව්‍යාප්තව තිබීම ප්‍රමුඛ අපනයන ආර්ථික බෝගය බවට පත් විය.

04)

i. ලන්ඩන්, බැප්ටිස්ට්

ii. A - රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමි
B - හෙලේනා බැලැව්ස්කි මැතිනිය
C - පොන්නම්බලම් රාමනාදන්
D - ටී. බී. ජයා

iii. මිෂනාරීන් ආගම් ප්‍රචාරක කටයුතු නිසා දේශීය ආගම්වලට පහර වැදීම
බ්‍රිතාන්‍ය පාලනය යටතේ ස්වකීය සංස්කෘතිය විනාශ වෙතැයි හැඟීමක් ස්වදේශිකයන්ට ඇතිවීම.

05)

i. උපකාරක ගිවිසුම් ක්‍රමය, අස්වාමික න්‍යාය

ii. A - ඩබ්ලිව්. සී. බෙනර්ජි, දඩාභායි නඖරෝජි
B - බ්‍රහ්ම සමාජය
C - මවුන්ට් බැටන් සාමි

iii. 1919 ජලියන්වලා බාග් නගරයේ රැස්වීමකට පැමිණි දහස් සංඛ්‍යාත නිරායුධ ඉන්දියානු පිරිසකට හමුදාව විසින් වෙඩි තබන ලදී. මෙම වෙඩි තැබීම හේතුවෙන් 400 ක පමණ ඉන්දියානුවන් පිරිසක් මියගිය අතර තවත් විශාල පිරිසක් තුවාල ලැබූහ. මෙය ජලියන්වලා බාග් ඛේදවාචකය ලෙස හඳුන්වයි. (පිටුව 89)

06)

i. උතුරු, දකුණු, නැගෙනහිර, බස්නාහිර, මධ්‍යම

ii. ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම.
උඩරට පහතරට ඒකාබද්ධ පාලන ක්‍රමයක් පිහිටුවීම
අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් කිරීම

iii. රාජ්‍ය මන්ත්‍රණ සභාව
සර්ව ජන ඡන්දබලය
විධායක කාරක සභා ක්‍රමය (පිටු 107, 108)

07)

1. ඩී. එස්. සේනානායක
2. C
3. ඩඩ්ලි සේනානායක
4. B
5. ජෝන් කොතලාවල
6. A
7. පාර්ලිමේන්තුව
8. F
9. විලියම් ගොපල්ලව
10. E
11. පේරාදෙණිය
12. D

PAST PAPERS WIKI
(2) WWW.PastPapers.WiKi (2)

Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න